## ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක පාලර්මේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ අද පාලර්මේන්තුවේ දී කළ සම්පූණර් අදහස් දැක්වීම.

"මන්ත්‍රීතුමිය, විශේෂයෙන්ම මේ වසරේ අවුරුදු 16ට අඩු දරුවන් සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් දඩ මුදල වැඩි කිරීම පිළිබඳව අපේ විරෝධතාවයක් නෑ. එය විය යුතු කාරණයක්. ඒ වගේම අපි දැනගන්න කැමතියි මේ වෙනකොට එවැනි පැමිණිලි කීයක් රජයේ ආයතන වලට ලැබිලා තියෙනවාද කියන කාරණය සහ ඒ ලැබිච්ච පැමිණිලි වලට ඒ අදාළ ආයතන සහ ආණ්ඩුව විදියට ඔබ ගත්තු ක්‍රියාමාගර්යන් පිළිබඳවත් දැනගන්න කැමතියි ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය.

දැන් මේ හැමෝම කතා කරනවා මේ 22 ගැන. දැන් මේ දවස්වල පාලර්මේන්තුවේ පිටත ආණ්ඩු පක්ෂයේ අය තමන්ගේ කාලයේ සියලුම දේ වැය කරලා මේ 22 ආරක්ෂා කරන්න කටයුතු කරනවා. අපිත් ඔහොම කරා ඒ කාලේ සමහර ඒවට. හැබැයි පහුකාලීනව තමයි ඒවයේ යථාථර්ය ගරු සභාපතිතුමිය අපිට තේරෙන්න පටන් ගත්තේ. ඉතින් හැබැයි අද අඩු ගානෙන් අපෙන්වත් පාඩම් ඉගෙන ගන්නේ නැතුව, ඔබතුමන්ලා ඒ ගන්න ක්‍රියාමාගර්ය පිළිබඳව ඔබ ඉදිරියේදී තේරුම් ගනී.

මේ අවුරුදු 16ට අඩු දරුවන්ට රැකියා කරන්න තියා ගරු සභාපතිතුමිය, මේ 18ට වැඩි ළමයින්ටවත් රස්සා නැති තත්වයක් අද උදා වෙලා තියෙනවා. එන්න එන්න කමර්ාන්තශාලා වැහෙනවා. ගොවි ජනතාව අසරණ වෙලා. වී විකුණගන්න විදියක් නෑ. ධීවරයාගේ අස්වැන්න විකුණගන්න විදියක් නෑ. අනිත් පැත්තෙන් විදේශීය ණය දිනෙන් දින වැඩි වෙනවා. ඉස්පිරිතාල වල බෙහෙත් නෑ. දැන් පිළිකා රෝගීන්ගේ ප්‍රතිශක්තිකරණය වැඩි කරන්න අවශ්‍ය බෙහෙත් දැඩි හිඟයක් තියෙනවා රජයේ සහ පෞද්ගලික රෝහල් වල. ඒවා පිළිබඳව ආණ්ඩුවේ මතය සහ ඒවට ආණ්ඩුවේ ලැබෙන මැදිහත්වීම පිළිබඳව ඉතාමත් අඩුයි.

හැබැයි ගරු විනිශ්චයකාරවරුන්ගේ වයස දීසර් කිරීම සඳහා ආණ්ඩුව සියලු පාශර්වයන්ට විරුද්ධව ගිහිල්ලා හරි කටයුතු කරනවා. දැන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ ඔබතුමන්ලා මේ සිස්ටම් එකේ සියලු දෙනාට විරුද්ධව ගිහිල්ලා රැකියා ප්‍රශ්නයට විසඳුමක් දෙයි, උපාධිධාරීන්ට රස්සා දෙයි, ආයෝජකයෝ ගෙනෙයි, කමර්ාන්ත අරියි වහයි කියලා නෙවෙයි.  ඔබලා වහනවා. කමර්ාන්තශාලා අලුතෙන් ඉදි කරයි. රාජ්‍ය සේවයේ තියෙන අපහසුතාවයන් පිළිබඳව තේරුම් අරගෙන ඒවට උත්තර දෙයි. රාජ්‍ය සේවකයා ආරක්ෂා කරයි, වැඩ කරන අයව,

හැබැයි අද ග්‍රාම සේවක මහත්වරුන්ගේ ප්‍රශ්න විසඳයි. අද ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඒ සියලු ප්‍රශ්න පැත්තක තියලා ඔබගේ අවශ්‍යතාවය මත, මං වගකීමකින් කියන්නේ, ඔබගේ ගැලවීම සඳහා, ඔබතුමන්ලාගේ ආරක්ෂාව සඳහා ගරු විනිශ්චයකාරවරුන්ගේ කාලය දීසර් කරනවා.

දැන් මං දැක්කා මේ සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු කියනවා මේ විනිශ්චයකාරවරුන්ගේ කාලය දීසර් කිරීමට විරුද්ධ වෙන්නේ හොරුලු, ප්‍රශ්න තියෙන අයලු.

දැන් ගරු සභාපතිතුමිය, ගරු මහා නායක හාමුදුරුවනුත් හොරුද මේ ආණ්ඩුව කියන විදියට? මේ රටේ නීතිඥ සංගමයත් හොරුද? එතකොට UN එක? එතකොට පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය ඒත් හොරුද? එතකොට ආසියාතික නීතිඥ සංගමය ඒක ඉන්නෙත් හොරුද? දැන් ඔබතුමාලාගේ පක්ෂයේ, JVP එකේ නීතිඥ සංගමය නියෝජනය කරන අය ජනාධිපතිතුමා එක්ක නීතිඥ සංගමය එක්ක සාකච්ඡාවට ගියේ නැද්ද? ගිහිල්ලා ජනාධිපතිතුමාට කිව්වේ නැද්ද මේක කරන්න එපා කියලා? එතකොට ඒ අයත් හොරුද?

දැන් ඔබතුමන්ලාගේ න්‍යාය අනුව මේ පාලර්මේන්තුවේ ඉන්න 159 දෙනයි, ජනාධිපතිතුමායි, අර ඔබගේ පක්ෂයේ ඉන්න නීතිඥවරුත් හොරු. එහෙමනේ කියන්නේ? ගරු මහා නායක හාමුදුරුවරුත් හොරු. දැන් මීට පෙරත් ගරු මහා නායක හාමුදුරුවරු මේ විගණකාධිපති පත් කරන වෙලාවෙත් යම් ඉල්ලීමක් කරා. ඔබ ඒකට ඇහුම්කන් දුන්නේ නෑ. අඩු ගානෙන් මේ පිළිතුරක් දෙන්න... එහෙමවත් නෑ.

මේ රටේ ඉතිහාසයේ පළමු වතාවට ගරු මහා නායක හාමුදුරුවන්ගේ ඉල්ලීමක් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කරනවා. හේතුවක් දක්වනවා නම් ඒක අපිට බලන්න පුළුවන්. ඒ වගේම තමයි ඔබ ඇයි මේ කිසි පාශර්වයකට ඇහුම්කන් දෙන්නේ නැතුව ගරු සභාපතිතුමිය කට ඇරපු ගමන් ආ ඒ ඔක්කොම හොරු කියලා පැත්තකට වෙනවා.

හැබැයි ඔබතුමන්ලාගේම නීතිඥ සංගමයේ ඔබතුමන්ලාගේ පක්ෂයන් ගියොත් දැන් හොරු වෙලා. දැන් එහෙමනේ කියන්නේ.

දැන් බලන්න ගරු සභාපතිතුමිය, මේ පහුගිය කාල සීමාව තුළ මේ ඔබේ ආරක්ෂාවට කෙරෙන්නේ. මේ මේ පහුගිය ආණ්ඩුවල නඩු අහන්න ඒකට නෙවෙයි මේ දීසර් කිරීම කරන්නේ. මේ අධිකරණයට බලපෑම් කරන්න ඔබ උත්සාහ කරන්නේ ඒ හින්දා නෙවෙයි. මේ පාලර්මේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු ඔබතුමන්ලාගේ පක්ෂයේ වරෙන්තු ආවාම උසාවි යන්නේ නෑ. උසාවි මගාරිනවා. වරෙන්තු කරන ගරු පහළ විනිශ්චයකාරවරු මාරු කරනවා.

පහුගිය කාලේ පහළ අධිකරණවල ගරු විනිශ්චයකාරතුමාලා මුණගැහිලත් මේ 22වන සංශෝධනයට විරුද්ධ වුනා. ඒ කියන්නේ පහළ අධිකරණවල ගරු විනිශ්චයකාරවරුත් හොරුද ඔබතුමාලාගේ න්‍යාය පත්‍රය අනුව?

අද මේ පාලර්මේන්තුව ඇතුලේ ඔබතුමන්ලාගේ වරෙන්තු තියෙන කී දෙනෙක් ඉන්නවාද? ඒ අය වරෙන්තු ආවාම උසාවි යන්නෙත් නෑ. සමහර විනිශ්චයකාරවරු මාරු කරනවා. බීලා හැප්පුනාම 25000 දඩය 2,500ට අඩු කරගන්නවා. මේ ඔබතුමාලාගේ ආණ්ඩුවේ අය.

ඒවා ආරක්ෂා කරන්නද මේ කරන්නේ? කන්ටේනර් 323ක් පැන්නුවා වරායෙන්! වරායෙන් කන්ටේනර් 323ක් පැන්නුවා. දැන් මේ නඩු අහනවා ඉස්සරහට. ඒ නඩු අහනකොට ඒවට අවශ්‍ය බලපෑම කරන්නද ඔබතුමන්ලා මේ ලෑස්ති වෙන්නේ කියන ප්‍රශ්නය අපි අහනවා.

අර මුදල් අමාත්‍යාංශයේ වැරදි ගිණුමකට ඩොලර් මිලියන 2.5ක් මාරු කරා. ඒකේ ප්‍රධාන සාක්ෂිකාරයා, පැමිණිලිකාරයා බලනහරය, අතපය කැපිලා මැරිලා. මරාගත්තද, මැරුවද, සියදිවි නසාගත්තද කියන එක ප්‍රශ්නයක්.

ගරු සභාපතිතුමිය, ගල්අඟුරු සම්බන්ධයෙන් ගල්අඟුරු වංචාවේ නඩුව එනවා. ඒවා ආරක්ෂා කරන්න තමයි ඔබතුමන්ලා අධිකරණයට බලපෑම් කරන්නත් උත්සාහ කරන්නේ. මේ වෙන මොකටවත් නෙවෙයි. ආ තැපැල් එකේ වැරදි ගිණුමකට සල්ලි දැම්මා. ජනාධිපති ලේකම්වරයා, අන්න වරායෙන් කන්ටේනර් පන්නලා වැරදිකාරයෙක් වෙලා, වරායෙන් කන්ටේනර් පන්නපු නිලධාරියෙක්ව ජනාධිපති ලේකම් බවට ජනාධිපතිවරයා පත් කරලා හොරු අල්ලන්න කතා කරනවා. ආයේ මොන කතාද

ගරු සභාපතිතුමිය, මේ නඩුව එනකොට තමයි ඔබතුමන්ලා පැහැදිලිවම ලෑස්ති වෙන්නේ මේ අධිකරණ පද්ධතියට බලපෑමක් කරලා තමන්ට ඕනි විදියට අධිකරණ පද්ධතිය හසුරුවන්න.

හැබැයි ඔබතුමාලා කියන්නේ මොකක්ද? මේ විපක්ෂය බය වෙලා... නෑ, විපක්ෂය නෙවෙයි, ආණ්ඩු පක්ෂය බය වෙලා තියෙන්නේ! අද ඔබතුමාලා හිතනවා නම් මේ මැතිවරණ තියන්නේ නැතුව මැතිවරණ තියන්නේ නැතුව ගරු

සභාපතිතුමිය කාලයක් ඇදගෙන යන්න පුළුවන් නම්, ඒ කාරණා සාථර්ක වෙන්නේ නෑ. කවුරු කවුරු ඔබතුමන්ලා වයස දීඝර් කරලා මේකේ තියාගත්තත් ඡන්ද තියන්න වෙනවා! ඒ කවුරු තියාගත්තත් ඡන්ද තියන්නත් වෙනවා, මේ නඩු අහන්නත් වෙනවා.

ඒ නඩු අහන්නත් වෙනවා වගේම මං මේ ඉස්සරහා ඉන්නවානේ... අනේ ගරු සභාපතිතුමිය, මම ගියාට පස්සේ මාව හොයන්න එපා කියන්න. මම ඉන්න වෙලාවක තියෙන ප්‍රශ්නයක් මගේ මූණට මූණ අහන්න කියන්න. උදේ ඉඳන් හවස වෙනකම් මාව හොයනවා. ඉන්න වෙලාවේ බුදියගෙන ඉන්නවා. ඉඳලා ගියාට පස්සේ 'කෝ නාමල්? කොහෙද යන්නේ?' කොහෙවත් නෑ මේ ඉන්නවා! තියෙන ප්‍රශ්නයක් දැන් අහන්න කියන්න. මගේ කාලෙත් ඕනම් දෙන්නම්. හැබැයි ගියාට පස්සේ 'අන්න හොයනවා, කෝ දැන් කෝ' කියලා මුලු දවසම මේ මාව හොයන්න එපා කියලා මං ඉල්ලීමක් කරනවා. තියෙනවා නම් ප්‍රශ්නයක් දැන් අහන්න මූණට ආත්මශක්තියක් තියෙනවා නම්.

ගරු සභාපතිතුමිය, ඒ වගේම අර අපේ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය... එතුමිය මේ පාලර්මේන්තුවට කියන කාරණා සම්බන්ධයෙන් ඔබතුමියලා පුරුද්දක් විදියට ආණ්ඩු පක්ෂයේ මේ හැන්සාඩ් එකෙන්ම ඉවත් කරනවා. මේ හැන්සාඩ් එකෙන් ඉවත් කරන එක නෙවෙයි කළ යුත්තේ. යම් ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීවරියක් විදියට පාලර්මේන්තුවේ ඇහුවාම ඒකට ඇහුම්කන් දීලා අවශ්‍ය පියවර ගන්න. ඔබතුමාලට අවශ්‍ය නම් අපි ඉල්ලීමක් කරනවා ඒකට සිලෙක්ට් කමිටුවක් දාන්න. පාලර්මේන්තු සිලෙක්ට් කමිටුවක් දාන්න. සිලෙක්ට් කමිටුවක් පත් කරලා එතුමිය මේ පාලර්මේන්තුවේ කියන කාරණා පිළිබඳව අධ්‍යයනය කරන්න. එහෙම නැත්නම් ගත් කටටම අහපු ගමන්, නැගිට්ට ගමන්, ප්‍රශ්නයක් ඉදිරිපත් කරපු ගමන් තව කෙනෙක් නැගිටලා ඒකට විරුද්ධව කතා කරලා ඒක හැන්සාඩ් එකෙනුත් ඉවත් කරන එක නෙවෙයි කළ යුත්තේ.

ඒ හින්දා අපි ඉල්ලනවා ඔබතුමියගෙන්, කරුණාකරලා ගරු කථානායකතුමා දැනුවත් කරන්න රෝහිණී කවිරත්න ගරු පාලර්මේන්තු මන්ත්‍රීතුමිය ඒ කියන කාරණා සම්බන්ධයෙන් පාලර්මේන්තුවේ තේරීම් කාරක සභාවක් පත් කරන්න. ඒ කාරණා ගැන හොයන්න. ඒ එක්කම මේ 22, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිට දාලා ජනතාවගේ ප්‍රශ්න නම් යට ගහන්නත් ලැස්ති වෙන්න එපා කියලා ඉල්ලනවා."